# කර්නල් ගඩාපි සහ පුත්‍ර සමාගම

මුඅමර් එල් ගඩාපි ලොකයේ දීර්ඝතම කාලයක් බලයේ සිටින රාජ්‍ය පාලකයන් අතර සිටින හතර වැන්නා ය. වසර 63 ක් රජකම දරණ තායිලන්තයේ භූමිබෝල් ඉන් පළමු වැන්නාය. දෙවැනි තැන දරන්නේ වසර 57 ක් කිරුළ හොබවන එංගලන්තයේ එලිසබෙත් මහ රැජින ය. තෙවැන්නා විධායක බලය ද ඇති 41 වසරක් බ්‍රනායි පාලනය කරන සුල්තාන් හසනල් බොල්කි ය. මෙම සතර දෙනා අතරින් රට පාලනය කිරීමේ සියලු බලය ඇති එකම පාලකයා මුමර් ගඩාපි ය. දීර්ඝතම කාලයක් බලයේ සිටි තවත් අත්තනෝමතික අප්‍රිකානු දේශපාලනඥයකු වූ ගබෝන් හි ජනාධිපති වසර 42 ක් ජනාධිපතිධුරය දරා වසය 73 දී මියගියේ පසුගිය වසරේ ජූනි 08 දා ය. ජීවත්වන තවත් එවැනි පාලකයකු නම් 1980 සිට වසර 30 ක් එරට පාලනය කරන කුප්‍රකට රොබට් මුගාබේ ය. දීර්ඝ කාලයක් කවර හෝ පාලකයකු විසින් රටක් සහමුලින්ම පාලනය කරනු ලබන කළ දක්නට ලැබෙන පොදු ලක්ෂණයක් තිබේ. එනම් ස්වකීය පාලනය සදාකාලික කර ගැනීම පිණිස පුරවැසියන්ගේ මානව සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් උදුරාගැනීම ය.

ගඩාපි හමුදා කුමණ්තණයක් මගින් බලය අල්ලා ගත්තේ 1969 සැපැතැම්බර් 01දා ය. එවකට ගඩාපි 27 හැවිරිදි තරුණ හමුදා කපිතාන්වරයකු විය. කුමන්ත්‍රණයෙන් පසු ඔහු තමා කර්නල් තනතුරට උසස් කර ගත්තේ ය.

රොබට් මුගාබේ මෙන්ම ගඩාපි ද මතුවූයේ විප්ලවවාදී නායකයකු ලෙස ය. ගඩාපි එතෙක් ලිබියාව පාලනය කළ ඉර්දිස් රජපෙළපත පෙරළා දමා ලිබියාව අරාබි සමූහාණ්ඩුවක් බවට පත් කළේ ය. විප්ලවීය කවුන්සිලයේ සභාපති සහ අගමැති ධුරය ද දැරූ නමුත් අද ගඩාපිගේ නිල පාලන ධුරය හඳුන්වනු ලබන්නේ **සහෝදර ගඩාපි සහ විප්ලවයේ පහන්තරුව** යනුවෙනි. අප්‍රිකාවේ චේ ගුවේරා යන නමින් ද ගඩාපි කළක් ප්‍රසිද්ධ ව සිටියේ ලොව පුරා සන්නද්ධ විප්ලවවාදී සංවිධානයන්ට මුල් කාලයේ ඔහු ලබාදුන් ප්‍රබල සහාය නිසා ය. ලිබියාව 30 වසරක් ඉතාලි යටත් විජිතයක්ව තිබුණි. බලයට පැමිණි වහාම ගඩාපි ඉතාලි බස භාවිත කිරීම තහනම් කොට එරට සිටි ඉතාලියානුවන් පිටමං කිරීමට පියවර ගත්තේ ය. අද ජනතාවගේ පාලනය යන අර්ථය දෙන "ජමහිරයා" යන්න පාලන දර්ශන යි. එය ප්‍රයෝගික වශයෙන් ගඩාපිගේ එහි තනි පාලනයට කියන වෙනත් නමක් බවට පත් ව තිබේ. අද ගඩාපිට පැරණි යුගොස්ලොවියානු ආණ්ඩුව විසින් ලබාදෙන ලද ආචාර්ය උපාධියක් ද තිබේ.

නමුත් කාලය සහ බලය විසින් ගඩාපි ද ස්වකීය බලයෙන් උදම් වූ සහ කිසිදු විරුද්ධ දේශපාලන මතවාදයකට හෝ සංවිධානයකට ඉඩ නොදෙන අත්තනෝමතික පාලකයකු බවට පත්විය. තමා බලයට පත්වීමේ 40 වැනි සංවත්සරය වෙනුවෙන් පසුගිය වසරේ සැප්තැම්බරයේදී ගඩාපි දැවැන්ත සංදර්ශනයක් සංවිධානය කළේ ය. එය ඔලිම්පික් සමාරම්භක උලෙළකට නොදෙවෙනි ලෙස සංවිධානය කෙරුණි. ඊට සහභාගි වූ රාජ්‍ය පාලකයින් අතර ඒකාධිපති රොබට් මුගාබේ, යුද අපරාධ චෝදනා මත දඩුවම් නියම කර ඇති සූඩාන පාලක ඕමාර් හුසේන් අලි බෂිර් සහ වෙනිසියුලාවේ හියුගෝ චාවේස් කැපී පෙනුණි. බටහිර රටවල නායකයෝ උළෙල වර්ජනය කළහ.

2009 සැප්තැම්බර් මාසයේදී සිය ජීවිතයේ ප්‍රථම වතාවට අමෙරිකා එක්සත් ජනපදයට ගඩාපි ගියේ එක්සත් ජාතීන්ගේ මහා සමුළුවට සහභාගි වීමට ය. සාමාන්‍යයෙන් රාජ්‍ය නායකයකුගේ කතාවකට වෙන් කැරෙන්නේ විනාඩි 15ක් පමණක් වුවත් එහි ඔහු විනාඩි 100 ක දීර්ඝ කතාවක් කළේ ය. සිය කතාව අතර තුර ඔහු එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය කැබලිවලට ඉරුවේ අනෙක් රාජ්‍ය ප්‍රධානීන් තිගැස්මට පත් කරමිනි. එම කතාවේදී අමෙරිකාවට, චීනයට, රුසියාවට, බ්‍රිතාන්‍යට සහ ප්‍රංශයට බැට දුන් ගඩාපි එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය අල් කයිඩා ත්‍රස්තවාදී සංවිධානයට සමාන කළේ ය. එමෙන්ම හිටපු බ්‍රිතාන්‍ය අගමැති ටෝනි බ්ලෙයර් සහ හිටපු අමෙරිකානු ජනාධිපති වූ ජෝර් බුෂ් යුද අධිකරණයට යැවිය යුතු බවට ප්‍රකාශ කළේ ය. ඒ අතින් ඔහු අපේ සමහර දේශපාලනඥයන් සමඟ ජාඩියට මූඩිය මෙන් පෑහේ. එමෙන්ම සූකර උණ යැයි කලින් හැඳින්වුණු H1N1 උණ රෝගය යුද රසායනාගාරයක නිශ්පාදනයක් නොවේදැයි ප්‍රශ්න කළේ ය. බරක් ඔබාමාට හොඳ කියා ඔහු ජීවිත කාලය පුරාම අමෙරිකාවේ ජනාධිපතිව සිටිනු ඇතැයි ද ප්‍රාර්ථනා කළේ ය.

කුමන රටකට ගියත් ගඩාපි තමා නිදාගැනීම පිණිස කූඩාරමක් රැගෙන යයි. ලිබියාවේ සෑම පුද්ගලයකුටම ප්‍රමාණවත් නිවෙසක් ලැබෙන තුරු තමා නිවෙසක නිදාගන්නේ නැතැයි ගඩාපි ප්‍රකාශ කළේ බලයට පත් විප්ලවකාරී අවධියේ ය. එමෙන්ම තමා අයත් වන එඬේර ගෝත්‍රයේ සම්ප්‍රදාය රැකීමක් වශයෙන්ද කූඩාරම සෑම තැනම රැගෙන යාම ඔහු පෙන්නුම් කරයි. මෙම කූඩාරම රඳාපවතින්නේ රනින් නිමකළ පාද 12 මත ය. සියලු සැප පහසුකම් වලින් පිරි මෙම කූඩාරමෙහි කවිච්චි ගණනාවක් ද, විදුලියෙන් කූඩාරම උණුසුම් කරන තාපක මෙන්ම සුවඳ දුම් දැල්වෙන භාජනයක් ද ඇති බව ජනමාධ්‍ය වාර්තා කළේ ය.

ගඩාපි ලොකු වැඩවලට කැමැති ය. 2008 ඉතාලියට ගිය ඔහු ව්‍යවසායක, දේශපාලන සහ සංස්කෘතික යනාදී අංශයන් නියෝජනය කරන කාන්තාවන් 700 දෙනෙකු සමඟ. හමුවක් පැවැත් වීය. 2007 පැරිසියට ගිය අවස්ථාවේදී එලෙසින්ම කාන්තාවන් 1000ක් කැදවා හමුවක් පැවැත් වීය. ඔහු එහිදී කියේ තමාට "යුරෝපීය කාන්තාවන් බේරා ගැනීමට" අවශ්‍ය බව යි.

නයිජීරියාවට සහ ඇල්ජීරියාවට පසු අප්‍රිකාවේ විශාලතම තෙල් නිධි ඇත්තේ ලිබියාවේ ය. රටෙහි ජාතික අදායමෙන් සියයට 90ක් පමණම ලැබෙන්නේ තෙල් සහ ඛනිජ අපනයෙනි. දූෂණය සහ නාස්තිය නොවන්නට ලිබියාව අප්‍රිකාවේ දියුණුම රටක් බවට පත්වන්නට අවශ්‍ය සියලු අවශ්‍යතා සපුරා සිටියේ ය. 1951 දී නිදහස ලබන විට ලෝකයේ දුප්පත්ම රටක් ලෙස සිටි ලිබියාව තෙල්නිධි සොයා ගැනීමෙන් පසු මහත් වෙනසකට පත් විය. ජනගහනය ලක්ෂ 06 ක් පමණක් වන එරට ඒක පුද්ගල වාර්ෂික ආදායම අමෙරිකානු ඩොලර් 11,400කි. දුප්පත්කම දුලබ ය. ගඩාපි පිළිබඳ බොහෝ විවේචන එල්ල වන්නේ ඔහුගේ පාලන ක්‍රමය සම්බන්ධයෙනි. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සංස්ථා හෝ නිදහස් ජනමාධ්‍ය හෝ එරට නැත. එක් රේඩියෝ සේවාවක් හැර අන් සියලුම පුවත්පත්, ගුවන්විදුලි සේවා සහ රූපවාහිනී සේවා රජය සතු ය. විරුද්ධවාදීන්ට එරෙහි දරුණු මර්දනයක් පවත්වා ගෙනයන බැවින් රට තුළ කිසිදු විපාක්ෂික දේශපාලනයක් නැත.

ගඩාපිගේ මෙන්ම ලිබියාවේ ලොකුම හෙණයක් වී ඇත්තේ පියාගේ බලයෙන් ඉදිමී සිටින පුතුන් ය. මේ එක් පුතකුගේ අවනීතික ක්‍රියා සාධාරණීයකරණය පිණිස ගඩාපි 2009 වර්ශයේදී ස්විට්සර්ලන්තය ලෝක සිතියමෙන් මකා දැමිය යුතු බවට වූ අට සමුළුවට යෝජනාවක් ඉදිරිපත් කළේ ය. ඔහුට යකා නැඟ තිබුණේ හන්නිබාල් නමින් හැඳින්වෙන එක් පුත්‍රයකු ස්විට්සර්ලන්තයේ දී අත් අඩංගුවට ගෙන සිරගත කිරීම යි. මෙම අත්අඩංගුවට ගැනීම සිදුවූයේ 2008 වසරේ දී ස්විට්සර්ලන්ත හෝටලයක නවාතැන් ගෙන සිටි හන්නිබාල් ගඩාපි විසින් ඔහුගේම සේවකයකුට දරුණු ලෙස පහරදීම යි. ගඩාපි සිය පුත්‍රයාගේ වරද දකිනු වෙනුවට ස්විට්සර්ලන්තය සමඟ නොනවතින අරෝවක් පටන් ගත්තේ ය. ගඩාපිගේ සහෝදරිය වූ අයිශා කියා සිටියේ මේ අපරාධය වෙන්වෙන් ස්විට්සර්ලන්තයෙන් ඇහැට ඇහැක්, දතට දතක් ලබාගත යුතු බව යි. ලිබියාවෙහි වූ ස්විස් ව්‍යාපාර වසා දමන ලද අතර ස්විස් ව්‍යාපාරිකයන් දෙදෙනෙකු අත් අඩංගුවට ගන්නා ලදී. හන්නිබාල් නම් මෙම ගඩාපි පුත්‍රයා වේගසීමාව ඉක්මවා පැරිසියෙහි මෙන්ම කොපන්හේගන් හි ද සිය කාරය එළවීම සම්බන්ධයෙන් ද චෝදනා ලබා සිටියේ ය. තවත් වරක් පැරිසියෙහිදී සිය ගර්භණී, බිරිඳකට පහරදීම සම්බන්ධයෙන් සිව් මසක අත් හිටවූ සිර දඬුවමක් ද යුරෝ 500 ක දඩයක් ද හන්නිබාල්ට නියම කෙරුණි. එසේ තිබියදීත් ගඩාපි සිය පුත්‍රයා වෙනුවෙන් ලිබියාව පුරා උද්ඝෝෂන සංවිධානය කරවන ලදී. යන යන සෑම තැනකම ජරාකර ගන්නා අපේ ඇමැති පුත්‍රයන් ද මේ හන්නිබාල්ගේ සගයන් විය යුතු ය. ගඩාපිට ඉන්නේ මේ පුත්‍රයා පමණක් නොවේ. ඔහුට පුත්‍රයන් සත් දෙනෙකි. එක් දියණියකි. දහස් ගණනින් ඉරාක ජනයා ඝාතනය කළ ඉරාක ඒකාධිපතියා වූ සදාම් හුසේන් වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටියේ නීතිඥවරියක වන අභීෂා ය.

ගඩාපිගෙන් පසු රාජ්‍යත්වය පවරාදීම පිණිස සූදානම් කැරෙමින් සිටින සියිප් අල් ඉස්ලාම් නම් දෙවැනි පුත්‍රයා ගඩාපි අන්තර් ජාතික සුභසාධක ආයතනයේ ප්‍රධානියා ය. එංගලන්තයේ ආර්ථික විද්‍යා සරසවියේ උපාධිදාරියකු වන ඉස්ලාම් අන්තර් ජාතික ප්‍රජාව සමඟ කටයුතු කළ හැකි පුද්ගලයා ලෙස ඉදිරියට ගඩාපි විසින් ගෙන එමින් තිබේ.

ගඩාපිගේ ප්‍රථම පුත්‍රයා වන මහුමඩ් ලිබියාවේ ඔලිම්පික් කමිටුවේ ප්‍රධානියා ය. වරක් ඔහු පාප්තුමා ගැන ප්‍රසිද්ධියේ කියා සිටියේ හොඳම විසඳුම පාප්තුමා ඉස්ලාම් දහම වැළඳගැනීම බව යි.

තෙවැනි පුත්‍රයාගේ නම අල් සසඩි ය. ලිබියාවේ තෙල් ආදායමෙන් ප්‍රකෝටිපතියකු බවට පත්ව සිටින ඔහු පාපන්දු ක්‍රීඩාව සිය ජීවිතය සේ සළකයි. කිසිදු අන්තර් ජාතික මට්ටමක පාපන්දු තරඟයකට සහභාගි වී නැති නමුත් සිය මුදල් බලයෙන් යුරෝපා රටවල පාපන්දු සංගම්වලට එක් වී පාපන්දු ක්‍රීඩකයකු ලෙස පෙනී සිටි. ලිබියානු පාපන්දු සංගමයේ සභාපතිවරයා ද අල් සසඩි ය.

යුද හමුදා ලුතිනන් කර්නල්වරයකු වූ හතරවන පුත්‍රයා බිල්ලා ගඩාපි සිය පියාගේ දේශපාලන උදහසට ලක්ව වසර ගණනාවකට පෙර ඊජිප්තුවට පැන ගියේ ය. යුද හමුදා කුමන්ත්‍රණයකින් බලය අල්ලා ගැනීමට උත්සාහ දරුවේයැයි ඔහුට එරෙහිව චෝදනා නැගුණි. එලෙස චෝදනා ලද අනෙක් පිරිස් හුදකලා කර සිය පුත්‍රයා ආපසු ගෙන්වා ගත් ගඩාපි, ඔහු ලිබියාවේ ජාතික ආරක්ෂ උපදේශක ලෙස පත්කළේ ය.

ඉහත කී හන්නිබාල් පස්වැනි පුත්‍රයා වන අතර සයිප් අල් සහ කාමිස් නම් වන ඉතිරි පුත්‍රයින් දෙදෙනා ලිබියානු පොලිස් සේවයේ උසස් තනතුරු දරති.

විප්ලවයෙන් පටන් ගෙන ඒකාධිපතිවාදයෙන් අවසන් වන ලෝකයේ තවත් එක් දේශපාලනඥයකු බවට අද කර්නල් ගඩාපි පත්ව සිටී.

ස්වකීය රාජ්‍යත්වය දීර්ඝ කරගැනීම හැර අන් අපේක්ෂාවක් වරසා 41 ක් රට කරවන ගඩාපිට නැත. ගඩාපි සහ පුත්‍ර සමාගම අද ලිබියාව පාලනය කරයි. ඒ හැර ගඩාපිගේ ගජමිතුරු පාලකයන්ට ඔහුගෙන් ඉගෙන ගැනීමට අන් පාඩමක් නැත.

මුලට